## විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2020.06.19
## පළාත් ඉංජිනේරු කාර්යාංශය

2020 වර්ෂයේ දෙවන කාර්තුවට අදාලව 2020.06.19 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ වාර්තාව පහත ඉදිරිපත් කරමි.

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු ඒ.ඒ.පි.එස්.කේ.කරුණාරත්න මයා විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව පෙ.ව.9.30 ට රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

**රැස්වීමට සහභාගී වූ නිලධාරීන්**

1. ඒ.ඒ.පි.එස්.කේ.කරුණාරත්න මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය
2. කේ.කේ.එස්.මහේෂ් විජේසේකර මයා - ගොඩනැගිලි අධ්‍යක්‍ෂ - පළාත් ඉංජිනේරු කාර්යාංශය
3. ජී.ඩබ්.පී.පෙරේරා මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය
4. සී.එස්.ලොකුගේ මිය - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
5. ආ්.ඒ.ඩී.පී.ප්‍රසන්න මයා - විගණන අධිකාරි - ජාතික විගණන කාර්යාලය
6. කේ.ඩී.එල්. කඳනආරච්චි මිය- ප්‍රධාන ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය
7. එන්.එච්.සුමින්ද මයා - ප්‍රධාන අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව
8. ඒ.ටී.ජගත් ප්‍රියන්ත මයා - අධ්‍යක්‍ෂ, තොරතුරු තාක්‍ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය
9. ආර්.එල්.එන්.රාජපක්ෂ මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හෝමාගම
10. .එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බියගම
11. එල්.එම්.ඩී.ආර්. ද මෙල් මිය - ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය
12. අර්.ඒ.බී.රණසිංහ මයා - ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය
13. බී.ඩී.සී.එස්.බඹරගම මිය - පරිපාලන නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය
14. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
15. පී.පී.ඒ.නිසංසලා මිය - සංවර්ධන නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය
16. ජේ.චමින්ද මයා - කළමනාකරණ සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය

**01. සාකච්ඡා කළ පොදු කරුණු**

| | | මතුකළ කරුණු | පැහැදිලි කිරිම | තීරණය |
|---|---|---|---|---|
| 1.1 | සී.එස්.ලොකුගේ මිය - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය | තවදුරටත් පිළිතුරු නොසැපයු විගණන විමසුම් 3 ක් සඳහා පිළිතුරු නියමිත දිනයට නොසැපයිම විගණනයෙන් මතුකරන ලද කරුණු සඳහා | (I) ප්‍රධාන ලේකම් අමතා පිටපතක් යොමුකර ඇති WNP/CB/R/CS/2020/AQ /10 විගණන විමසුමට අදාල අංග සම්පූර්ණ වාර්තාවක් ලබාදෙන ලෙස මුලස්ථාන ඉංජිනේරු හට දන්වා ඇති | සති දෙකක් තුල අදාල වාර්තාව ලබාගෙන වාර්තා කිරිම |

| | | | | |
|---|---|---|---|---|
| | | පිළිතුරු ලිපියක් එවීම පමණක් ප්‍රමාණවත් නොවන බවත්, එමගින් දක්වා ඇති අඩුපාඩු ඉදිරියේදී සිදු නොවීමට ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ විගණක අවධානයෙන් සිටින බව දැන්විය | අතර ඊට අදාල පිළිතුරු 2020.03.10 දින PRD ආයතනයෙන් ඉල්ලුම්කර ඇත. එම වාර්තාව මත අදාල පැහැදිලි කිරීම ප්‍රධාන ලේකම්ට දන්වා පිටපතක් විගණන අංශයට එවීමට කටයුතු කරන බව<br><br>(II) හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල විගණන විමසුමට අදාලව අතුරු පිළිතුරක් විගණනයට ඉදිරිපත්කර ඇතත් මෙම කරුණට අදාලව රජයේ විගණන අංශයෙන් මෙන්ම අභ්‍යන්තර විගණන අංශයෙන් ද විමසුම් කර ඇති හෙයින් අදාල විගණන ඡේද සම්බන්ධ හෝමාගම ඉංජිනේරු විසින් ඒවා ඇති පිළිතුරු කෙටුම්පත පිළිබඳව තීරණයක් ලබා ගැනීමට අධ්‍යක්ෂ (ඉංජිනේරු) ගොඩනැගිලි අධ්‍යක්ෂ වෙත ලිඛිතව දන්වා ඇති බැවි නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) සඳහන් කරන ලද අතර එම වාර්තාව සතියක් තුළ ලබාදීමට අධ්‍යක්ෂ ඉංජිනේරු එකඟ විය. | සති දෙකක් තුල අදාල නිරීක්ෂණ වාර්තා ලබාගෙන පිළිතුරු ඉදිරිපත් කිරීම. |
| 1.2 | ඊ්.ඒ.ඩී.පී.ප්‍රසන්න මයා - විගණන අධිකාරි - ජාතික විගණන කාර්යාලය | (1) තාක්‍ෂණ ඇගයීම් කමිටුව සඳහා ගිණුම් හා මූල්‍ය කටයුතු පිළිබඳ දැනුම ඇති නිලධාරියෙකු පත් කිරීම සුදුසු බව.<br><br>ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ මුදල් පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරියට යැවීමට බලයදීම පිළිබඳවත්, අත්තිකාරම් වශයෙන් මුදල් ලබා දී | ප්‍රසම්පාදන කමිටු හා තාක්‍ෂණ ඇගයීම් කමිටු සම්බන්ධව සියළුම ප්‍රාදේශීය හා ප්‍රසම්පාදන කමිටු හා තාක්‍ෂණ ඇගයීම් කමිටුවල සාමාජිකයන්/ ඉංජිනේරුවරුන් දැනුවත් විය යුතු බව<br><br>එම තත්ත්වය නිරවුල් කරගැනිමට කටයුතු කරන | සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් වෙත චක්‍රලේඛ උපදෙස් සංග්‍රහයක් නිකුත් කිරීම<br><br>තාක්‍ෂණ ඇගයීම් කටයුතු සඳහා ගණකාධිකාරිවරයෙකු සාමාජිකයෙකු ලෙස පත් කිරීමටත්, ඒ සඳහා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වලින් නම් කරන ලද නිලධාරියෙකු ප්‍රාදේශීය |

| | | | | |
|---|---|---|---|---|
| | | ඇති බවත්, වියදම් සහතික කිරීමේදී වියදම් සම්බන්ධයෙන් වගකීමට බැඳෙන බැවින් ගණන්දිමේ නිලධාරි ලෙස ඉංජිනේරු කාර්යාලයෙන් ගෙවීම්හි නිවැරදිතාවය පරීක්ෂා කළයුතු බව,<br><br>මූල්‍ය වගකීම ඉංජිනේරු කාර්යාලයට පැවරෙන බැවින් වියදම් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දැක්විය යුතු බවත්, පසු විපරම් සිදුකළ යුතු බවටත් පැහැදිලි කරන ලදි.<br><br>මෙම වියදම්වලට අදාලව දරා ඇති වියදම් පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට සිදුවන බවත් ප්‍රකාශ කරන ලදි. | | ඉංජිනේරුවරුන් විසින් දන්වා එවීමට කටයුතු කිරීම<br><br>නව ගොඩනැගිල්ල පිළිබඳ වියදම් ගිණුම්ගත කිරීම සහතික කිරීම පිළිබඳ පෙර සිටි නිලධාරින් සමඟ සාකච්ඡාකර ඉදිරි පියවර ගැනීම හා ඒ පිළිබඳව සති 02 ක් තුල සකස් කිරීමට තිරණය විය. |
| 1.3 | එන්.එච්.සුමින්ද මයා - ප්‍රධාන අභ්‍යන්තර විගණක | ඉදිරියෙදි ව්‍යාපෘති සඳහා මුදල් වෙන්කිරීමේදි ව්‍යාපෘති වාර්තාව අනිවාර්යයෙන්ම තිබිය යුතු බව.<br><br>විශේෂ කරුණු පිළිබඳව අභ්‍යන්තර විගණන අංශයෙන් ලබාදියුතු උපරිම සහාය දියහැකි බව ද දැන්විය. | | මේ සම්බන්ධ සාද්‍යතා වාර්තාවක් සකස් කර ඇති අතර එය ඉදිරියේදි කාර්යාල වෙත යැවීමට කටයුතු කරන බව දැන්විය. |

2. පසුගිය විගණන කළමනාකරණ වාර්තාවේ ප්‍රගතිය

| | සාකච්ඡා වූ කාරණය | ගත් ක්‍රියාමාර්ගය | වගකීම |
|---|---|---|---|
| 1 | "Complain Management" විගණන විමසුම<br>අංක: WNP/CB/R/EB/2020/AQ/5 හා 2020.02.10 | විගණන ජේද සම්බන්ධයෙන් ITRDA ආයතනයෙන් පැහැදිලි කිරීමක් 2020.06.22 දින ලබා දෙන බවට ITRDA අධ්‍යක්ෂ විසින් එකඟ වන ලද අතර, එහි ප්‍රධාන කාර්යාලයට අදාල ජේද සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් | ප්‍ර.ගණකාධිකාරි /ගණකාධිකාරි / මුලස්ථාන ඉංජිනේරු / විගණන විමසුම් විෂය නිලධාරි/ ITRDA ආයතනය |

| | | | |
|---|---|---|---|
| | | ලබා ගෙන සති දෙකක් ඇතුලත විගණයට පිළිතුරු සැපයීම. | |
| | පළාත් සහා නව ගොඩනැගිල්ලට ඔරලෝසු මිලදී ගැනීම WNP/CB/R/CS/2020/AQ/10 හා 2020.02.28 | මුලස්ථාන (ඉංජිනේරු) වෙතින් වාර්තාවක් කැඳවා ඇති අතර, එම පැහැදිලි කිරිම විගණනයට සති දෙකක් ඇතුලත දැන්වීම. | මුලස්ථාන ඉංජිනේරු නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුල්‍ය) වෙත පිළිතුරු සකස්කර යැවීම. |
| 2 | හය මාසය ඉක්මවා නිරවුල් නොවූ චෙක්පත් ප්‍රා.ඉ.කාර්යාලවල තවදුරටත් පැවතීම. | කාර්යාලවල රඳවා තබා ගෙන තිබූ චෙක්පත් පරීක්ෂාකර කඩිනමින් එම චෙක්පත් නිරවුල් කිරිමට කටයුතු කරන ලෙස අදාල ප්‍රාදේශීය ඉංජිනේරු වරුන් වෙත දන්වා ඇති අතර, තවදුරටත් ඉදිරිකටයුතු පසුවිපරම් කිරිම.<br><br>ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල 2020 මැයි මස දක්වා බැංකු සැසඳුම් සකස්කර අවසන් කර ඇත. | නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) ගණකාධිකාරි / පරිපාලන නිලධාරි<br>මේ වන විට සාර්ථකව ඉටුකර ඇත. |
| 3 | හානි පාඩු සම්බන්ධව | හානි පාඩු සම්බන්ධයෙන් දැනට කටයුතු සිදු කරමින් පවතින අතර වාහන අනතුරු සම්බන්ධ අවසන් වර්තාව මාස දෙකක ඇතුලත ඉදිරිපත් කිරිමටත්, මුල්‍ය රීති ප්‍රකාර ඉදිරි කටයුතු කිරිම. | පරිපාලන නිලධාරි අවස්ථා දෙකක් හැර ඉතිරි කටයුතු අවසන් කර ඇත. |
| 4 | අත්තිකාරම් බී ගිණුමට අදාලව ණය අය නොවිම. | අත්තිකාරම් බී ගිණුමේ ස්ථානමාරු වී ගිය නිලධාරින්ගෙන් ණයශේෂ අයකිරිම හා මියගිය විශ්‍රාමික ශේෂ හා සේවය හැරගිය අයගෙන් ණය ශේෂ නිරවුල් කිරිමට උපදෙස් ලබා දීම | ගණකාධිකාරි / විෂය කළමනාකරණ සේවා නිලධාරි |
| 5 | කල් ඉකුත්වූ තැන්පතු | මුල්‍ය රීති ප්‍රකාරව කල් ඉකුත්වූ තැන්පත් ගිණුමේ රඳවා ඇති තැන්පතු ශේෂ නිරවුල් කිරිමට අක්මුදල් ලබාගත යුතු අතර අක්මුදල් ලද පසු එම තැන්පත් නිරවුල් කිරිම. | ගණකාධිකාරි |
| 6 | ප්‍රාදේශීය කාර්යාල 13 හි භාවිතා කරන ඉදිකිරිම් සම්බන්ධ ගොනුවල හා ආකෘති පත්‍රවල පොදු භාවයක් නොතිබිම. | මේ සම්බන්ධයෙන් පත්කල කමිටු වාර්තාව ලබාගෙන සති දෙකක් තුල ආකෘති පොදු නාමයකින් පත්‍ර කටයුතු කිරිම. | නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු) අභ්‍යන්කර චක්‍ර ලේඛයක් මඟින් සියළු කාර්යාල දැනුවත් තිරිම |
| 11 | වාහන අනතුරු අළුත් වැඩියා සඳහා වැයවූ මුදල් රක්ෂණයෙන් අයකර ගැනීම | PF 2886 හා PF 3043 වාහන අළුත්වැඩියා සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රමාණයම රක්ෂණයෙන් ගෙවා නොමැති බව අභ්‍යන්තර විගණන නිලධාරි විසින් පවසන ලදි | පරිපාලන නිලධාරි |

| | | | |
|---|---|---|---|
| | | එබැවින් රාක්ෂණ ආයතනයෙන් නොගෙවන ලද මුදල අදාල රියදුරුගෙන හෝ වගකිව යුතු නිලධාරිගෙන් අයකර ගැනීම හෝ කපාහැරිම සම්බන්ධයෙන් කමිටුවක්පත් කර තිරණයක් ගන්නා ලෙස පාලන නිලධාරිට උපදෙස් දෙන ලදි. | |
| 13 | මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පවත්වාගෙන යන ධීවර සමිතිය | මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකරන ලද ඉංජිනේරු ආර්.ඒ.බී.රණසිංහ මයා විසින් කරුණු පැහැදිලි කිරිමක් සිදු කරන ලදි කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් මුදල් ලබාගෙන ගොඩනැගිල්ලක් ඉදිකර ඇතත්, ඉඩමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත සතුද යන්න මෙතෙක් තහවුරු වී නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම් විසින් මෙම ඉඩම අත්පත් ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බවත් අයිතිය තහවුරු කරගත් විගස නිතිමය ක්‍රියා මාර්ග ගැනිමට කටයුතු සිදු කරමින් පවතින බවත් ප්‍රකාශ කරන ලදි. | නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු)<br><br>ඉංජිනේරු ආර්.ඒ.බී.රණසිංහ මයා |
| | අවිස්සාවේල්ල නිවස හා ඉඩම | අවිස්සාවේල්ල නිවස හා ඉඩම් ශ්‍රී ලංගම වෙතින් පවරා ගැනීමට ප්‍රවාහන අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවක් සූදානම් කර තිබූ අතර රටේ ඇති වූ වාතාවරණය අනුව එම දිනයේදි සාකච්ඡා කිරිමට නොහැකි වූ බවත් ඒ සම්බන්ධයෙන් නැවත සාකච්ඡාවක් සිදුකරන බව ද ඉංජිනේරු ආර්.ඒ.බී.රණසිංහ මයා ප්‍රකාශ කරන ලදි.<br>දැනට ගෙවල් කුළි වශයෙන් රු:20,000/- මුදල ලබා ගැනීම ගැටළු සහගත බව විගණන අධිකාරි විසින් පැහැදිලි කරන ලදි. | ඉංජිනේරු ආර්.ඒ.බී.රණසිංහ මයා |
| 14 | බියගම ප්‍රාදේශීය ඉංජිනේරුවරු කාර්යාලයට නව ගොඩනැගිල්ලක් කුළියට ගැනිම සම්බන්ධව | දැනට බියගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය නව ගොඩනැගිල්ලකට ගෙන යාමේ අවශ්‍යතාවය නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු) විසින් අවධාරණය කරන ලද අතර, රන්මුතුගල සහතික කළ පාසැල් ඉඩමේ කොටසක් ලබා ගැනීමට පරිවාස කොමසාරිස් හා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් සමඟ සාකච්ඡාකර තිරණයක් ගෙන ඉදිරි කටයුතු කිරිම | ගොඩනැගිලි අධ්‍යක්ෂ බියගම ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| 15 | ප්‍රසම්පදන සම්බන්ධයෙන් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් දැනුවත් කිරිම හා තාක්‍ෂණ ඇගයිම් කමිටුව සඳහා ගණකාධිකාරිවරයකු නම් කිරිම පිළිබඳ | තාක්‍ෂණ ඇගයිම් කමිටු හා ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් කණ්ඩායම් වශයෙන් පුහුණු කිරිම<br><br>ප්‍රසම්පාදන හා තාක්‍ෂණ ඇගයිම් කමිටු සම්බන්ධයෙන් උපදෙස් සංග්‍රහයක් සැකසිම | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ ගොඩනැගිලි අධ්‍යක්‍ෂ / අධ්‍යක්‍ෂ (ඉංජිනේරු)/ ප්‍රධාන ගණකාධිකාරි |

රටේ පවතින කොරෝනා තත්ත්වය හා සෞඛ්‍ය උපදෙස් මත සියළුම ප්‍රාදේශීය කාර්යාලවල ඉංජිනේරුවරුන් නොකැඳවූ අතර සීමිත පිරිසක් පමණක් මෙම විගණන කළමනාකරණ කමිටු රැස්වීමට කැඳවන ලදි. තුන්වන කාර්තුව සඳහා සියළුම ප්‍රාදේශීය කාර්යාලවල ඉංජිනේරුවරුන් කැඳවීමට කටයුතු කරන ලද බවත් ප්‍රධාන ගණකාධිකාරි විසින් ප්‍රකාශ කරන ලදි.

ප්‍රධාන ගණකාධිකාරි කේ.ඩී.එල්.කඳනආරච්චි මිය විසින් ස්තුති කතාව සිදු කර රැස්වීමේ කටයුතු පස්වරු 1.00 ට පමණ අවසන් කරන ලදි.

ඒ.ඒ.පි.එස්.කේ.කරුණාරත්න,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).
පළාත් ඉංජිනේරු කාර්යාංශය
බස්නාහිර පළාත.